# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 121 / 2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2023

දිනය / திகதி / Date — 23/01/2024 පැය 1435

**මාධ්‍ය නිවේදනය**

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය වෙත වාර්තා වූ වැදගත් තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.**

**01. මත්කරල් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - මන්නාරම කොට්ඨාස අපරාධ විමර්ශන අංශය.**

2024.01.22 වන දින සවස් කාලයේ හා රාත්‍රී කාලයේ මන්නාරම කොට්ඨාස අපරාධ විමර්ශන අංශයේ නිලධාරීන් විසින් මන්නාරම පොලිස් වසමේ තාල්පාඩු හා කරවන්ටෙතාට්ටේ ප්‍රදේශයේදී වැටලීම් 02 ක් සිදුකර **මත්කරල් 1200 ක් සමඟ සැකකරුවන් දෙදෙනෙකු අත්අඩංගුවට** ගෙන මන්නාරම පොලිස් ස්ථානය වෙත භාරදී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරුවන් අවුරුදු 19 හා 23 වයස් වල පසුවන කරවන්ටෙතාට්ටේ ප්‍රදේශයේ පදිංචිකරුවන් වේ.**

මන්නාරම පොලිස් ස්ථානය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.

**02. මාරක රිය අනතුරක් - කටුපොත පොලිස් වසම.**

2024.01.22 වන දින රාත්‍රී කාලයේ කටුපොත පොලිස් වසමේ හස්කම්පල මඩලැස්ස අතුරු මාර්ගයේ නෙත්තිපොල ගෙදර හන්දිය අසලදී මඩලැස්ස දෙස සිට හස්කම්පොල දෙසට ධාවනය වූ යතුරුපැදියක් හස්කම්පල දෙස සිට මඩලැස්ස දෙසට මාර්ගයේ දකුණු පසින් ගමන් කල පදිකයෙකුගේ ගැටී අනතුරක් සිදුව ඇත. අනතුරින් තුවාල ලැබූ පදිකයා කටුපොත රෝහලට ඇතුලත් කර වැඩිදුර ප්‍රතිකාර සඳහා කුරුණෑගල රෝහලට මාරුකර යවා ප්‍රතිකාර ලබමින් සිටියදී මියගොස් ඇත. යතුරු පැදිකරුද ප්‍රතිකාර සඳහා නාරම්මල රෝහලට ඇතුලත් කර ඇත.

මරණකරු වයස අවුරුදු 54ක් වූ සියඹලාගස්කටුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.
මෘත ශරීරය කුරුණෑගල රෝහලේ මෘත ශරීරාගාරයේ තැන්පත් කර ඇති අතර කටුපොත පොලිසිය වැඩිදුර විමර්ශන සිදුකරනු ලබයි.